# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1709/47 - 2011 ජුනි 10 වැනි සිකුරාදා - 2011.06.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/15/16/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4(1) වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

කේ. ඩී. තිලකරත්න මයා.
අංක 189, රොක්ලන්ඩ්,
ගල්දොර පාර,
කඩවත

සහ

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
සභාපති අංශය,
අංක සී 82, ග්‍රෙගරි මාවත,
කොළඹ 07.

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පිලියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, අංක. 13/30 හි නීතිඥ සරත් ලියනගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ගාමිණී ලොකුගේ,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 ජුනි මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය : IR/15/16/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

කේ. ඩී. තිලකරත්න මයා.
අංක 189, රොක්ලන්ඩ්,
ගල්දොර පාර,
කඩවත

සහ

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
සභාපති අංශය,
අංක සී 82, ග්‍රෙගරි මාවත,
කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් 2005.05.06 වැනි දින සිට 2007.03.29 දින දක්වා වූ කාලසීමාව තුලදී එහි අධ්‍යක්ෂ (මුදල්) තනතුරෙහි වැඩ බැලීම සඳහා පත් කරනු ලැබූ කේ. ඩී. තිලකරත්න මහතාට වැඩබැලීමේ දීමනාවක් නොගෙවීම හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් වූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඔහුට හිමිවිය යුතු සහනයන් මොනවා ද යන්න පිළිබඳව වේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2011 මැයි මස 24 වැනි දින,
කොළඹ,
කම්කරු කොමසාරිස්තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

06-581

---

මගේ අංකය : IR/15/29/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4(1) වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව,

ෆෂ්ලි අස්හාර් මහතා,
අංක 06, රොඩ්රිගෝ පටුමග,
දෙහිවල

සහ

මෙඩිසෝස් ප්‍රයිවට් ලිමිටඩ්,
අංක 250, ටොරින්ටන් මාවත,
කොළඹ 07

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 05, අමරසේකර මාවත, අංක 34 හි නීතිඥ එම්. ඩී. කේ. කුලතුංග මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ගාමිණී ලොකුගේ,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 ජූනි මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය : IR/15/29/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරිය වන කාර්මික ආරවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ෆෂ්ලි අස්හාර් මහතා,
අංක 06, රොඩ්රිගෝ පටුමග,
දෙහිවල

සහ

මෙඩිසෝස් ප්‍රයිවට් ලිමිටඩ්,
අංක 250, ටොරින්ටන් මාවත,
කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ :

1. ෆෂ්ලි අස්හාර් මහතා මෙඩිසෝස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමෙන් වැටුප් ලබන සේවකයෙකු වශයෙන් සේවය කර තිබේ ද ?
2. එලෙස සේවය කර ඇත්නම් ඔහු එහි සේවය කළ කාලසීමාව කුමක් විය යුතු ද ?
3. එම සේවා කාලය වෙනුවෙන් වැටුප් හා අනෙකුත් දීමනා වශයෙන් ෆෂ්ලි අස්හාර් මහතාට යම් ගෙවීමක් කළ යුතු වන්නේ ද යන්න, හා
4. එසේ ගෙවිය යුතු වන්නේ නම් කුමන ප්‍රමාණයක මුදලක් ඔහුට ලැබිය යුතුද යන්න පිළිබඳව වේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2011 මැයි මස 09 වැනි දින,
කොළඹ,
කම්කරු කොමසාරිස් තැනගේකාර්යාලයේ දී දින යොදන ලදී.

06-582

---

මගේ අංකය : IR/10/23/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

ඒ. ඒ. ඩී. ඩී. චන්ද්‍රසිරි මයා,
අංක 59,
තල්වත්ත,
ගෝනවල (බ.ප.)

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය වන, ගාමිණී ලොකුගේ වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පිළියන්දල, කැස්බෑව, සර්වෝදය මාවත, අංක 13/30 හි නීතිඥ සරත් ලියනගේ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ගාමිණී ලොකුගේ,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 ජුනි මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය : IR/10/23/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඒ. ඒ. ඩී. ඩී. චන්ද්‍රසිරි මයා,
අංක 59,
තල්වත්ත,
ගෝනවල (බ.ප.)

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් 2006.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එම අධිකාරියේ VI ශ්‍රේණියේ ගණකාධිකාරී ඒ. ඒ. ඩී. ඩී. චන්ද්‍රසිරි මහතාගේ වැටුප් ප්‍රතිශෝධනය කිරීමේදී ඔහුට යම් අසාධාරණයක් වූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2011 මැයි මස 09 වැනි දින,
කොළඹ,
කම්කරු කොමසාරිස් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

06-583

මගේ අංකය : IR/22/10/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

එම්. ජී. පී. ජයලත් මයා,
ගල්පාය,
කැන්දගොල්ල,
කුරුඳුවත්ත කඩවීදිය,
ගම්පොල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුල පාර,
කොළඹ 05.

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් දෙහිවල, ගල්වල පාර, පැරකුම් මාවත, අංක 179/2 හි ඊ. එන්. ජී. එදිරිසිංහ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ගාමිණී ලොකුගේ,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 ජුනි මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය : IR/22/10/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එම්. ජී. පී. ජයලත් මයා,
ගල්පාය,
කැන්දගොල්ල,
කුරුඳුවත්ත කඩවීදිය,
ගම්පොල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුල පාර,
කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගම්පොල ඩිපෝවේ රියදුරෙකු වශයෙන් සේවය කරමින් සිටිය දී සිදුවූ රිය අනතුරක් සම්බන්ධයෙන් නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ විනය නිලධාරීගේ 2008.11.21 දිනැති විනය නියෝගය හා 2009.01.21 දිනැති එහි අභියාචනා මණ්ඩල සභාපතිගේ අභියාචනා නියෝගය මගින් එම්. ජී. පී. ජයලත් මහතා වෙත පමුණුවන ලද දඬුවම් යුක්තිසහගතද යන්න හා යුක්තිසහගත නොවන්නේ නම්, ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2011 මාර්තු මස 31 වැනි දින,
කොළඹ,
කම්කරු කොමසාරිස් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

06-584

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.